# සිංහල අවුරුදු සිරිත 2013

SARYA Graphics

## නව සඳ බැලීම

අභිනව චන්ද්‍ර වර්ෂය සහ අභිනව සූර්ය වර්ෂය සඳහා 2013 ක් වූ
**අප්‍රේල් මස 14 වන ඉරු දින** නවසඳ බැලීම මැනවි.

## පරණ අවුරුද්ද සඳහා ස්නානය කිරීම

**අප්‍රේල් මස 13** වන සෙනසුරාදා දින නුගපත් යුෂ මිශ්‍ර නානු ගා ස්නානය කොට,ඉෂ්ට දේවතානුස්මරණයෙහි යෙදී වාසය මැනවි.

## අලුත් අවුරුදු උදාව

ව්‍යවහාර වර්ෂ 2013 **අප්‍රේල් මස 14 වැනි ඉරිදා**
**පූර්වභාග** 01.29 ට අලුත් අවුරුද්ද උදාවෙයි.

## පුණ්‍ය කාලය

**අප්‍රේල් මස 13** වන සෙනසුරාදා
**අපරභාග 07.05 සිට 14 වන ඉරිදා පූර්වභාග 07.53 දක්වා** පුණ්‍ය කාලය බැවින්.
අප්‍රේල් මස 13 වන සෙනසුරාදා අපරභාග 07.05 ට පෙර
නා බී,සියලු වැඩ අත්හැර ආගමික වතාවත් වල යෙදීමද, පුණ්‍ය කාලයේ අපර කොටස තුළ එනම්, 14 වන **ඉරිදා පූර්වභාග** 01.29 **සිට පූර්වභාග 07.53** දක්වා පහත දක්වෙන අයුරු වැඩ ඇල්ලීම,ගනුදෙනු කිරීම හා ආහාර අනුභවය ආදී අවුරුදු චාරිත්‍ර විධි ඉටුකිරීමද මැනවි.

## ආහාර පිසීම

**අප්‍රේල් මස 14 වෙනි ඉරිදා පූර්වභාග** 04.06 ට **නිල්** පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී, **දකුණු දිශාව** බලා ලිප් බැඳගිනි මොළවා,ගිතෙල් සහ හකුරු මිශ්‍ර කිරිබත-ක්ද,තල මිශ්‍ර කැවිලි වර්ගයක්ද පිළියෙල කිරීම මැනවි.

## වැඩ ඇල්ලීම,ගනුදෙනු කිරීම හා ආහාර අනුභවය

**අප්‍රේල් 14 වන ඉරිදා පූර්වභාග** 07.05 ට
(රතු සහ කහ මිශ්‍රිතඹ පැහැති වස්ත්‍රාභරණයෙන්
සැරසී, **දකුණු දිශාව** බලා සියලු වැඩ අල්ලා,ගනුදෙනු කොට ආහාර අනුභවය මැනවි.

## හිසතෙල් ගෑම

**අප්‍රේල් 15 වන සඳුදා පූර්වභාග** 06.41 ට සුදු පැහැති වස්ත්‍රාභරණයෙන් සැර-සී,නැගෙනහිර දිශාව බලා,හිසට දිඹුල් පත්ද,පයට ඉඹුල් පත්ද තබා,තෙල් සහ දිඹුල් පත් යුෂ මිශ්‍ර නානුද ගා ස්නානය කිරීම මැනවි.

## රැකීරක්ෂා සඳහා පිටත්ව යාම

**අප්‍රේල් 17 වන බදාදා පූර්වභාග** 07.42 ට පලාවන් (කොළ)පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී,කිරිබත් හා හකුරු මිශ්‍ර ආහාරයක් අනුභව කර,දකුණු දිශාව බලා රැකීරක්ෂා සඳහා පිටත්වීම මැනවි.

## සේවා අවශ්‍යතා සඳහා පිටත්ව යාම

**අප්‍රේල් මස 15 වන සඳුදා පූර්වභාග** 06.53 ට සුදුපැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී, කිරිබත් හා කිරි මිශ්‍ර ආහාරයක් අනුභව කර,නැගෙනහිර දිශාව බලා. රැකීරක්ෂා සඳහා පිටත්ව යාම මැනවි.

ඉහත සියලු නැකැත් වේලාවන් පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා සම්මත ඔරලෝසු වේලාවට අනුව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සිංහල අලුත් අවුරුදු නැකැත් කමිටුව විසිනි.

SARYA Graphics

SARYA Graphics